# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,187 — 1962 ජුනි 29 වැනි සිකුරාදා — 1962.6.29

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාගයකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය ... | 973 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය ... | 973 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය | 974 |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 975 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 975 |
| මිල පාලන දැන්වීම ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 983 |
| "සුරාබදු ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 257

අංකය: සී/වී එෆ්/18 ඒ.

**රාජකීය ලංකා ස්වේච්ඡා නාවික හට සේනාව— අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද ස්ථිර කිරීම්**

පහත සඳහන් කරන ලද නිලධාරියා 1961 අගෝස්තු මස 1 වැනි දින සිට, උප ලෙප්ටිනන්ට් පදවියෙහි ස්ථිර කොට ඇත:—

වැඩ බලන උප ලෙප්ටිනන්ට් වී. සුබේන්ද්‍රනාතන්, රාජකීය ලංකා ස්වේච්ඡා නාවික හට හමුදාව.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

ඇන්. කියු. දියෙස්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1962 ජුනි 15 වෙනිදා,
කොළඹ දීය.

6—1336

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 258

ඒ. 168/62.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඇල්. බී. අබේරත්න මහතා 1962 මැයි මස 14 වැනි දින සිට ලංකා සිවිල් සේවයේ දෙවැනි පෙළේ සිට පළමු වැනි පෙළේ දෙවෙනි ශ්‍රේණියට උසස් කර ඇත.

සී. ජ. වල්පිට,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 ජුනි මස 25 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.
නැ. පෙ. 500.

6-1338/1

### විශෙෂ නිවේදනයයි

නිෂ්පාදන වියදම් අධිකවීමේ හේතුන් නිසා ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීමේ ගාස්තු වැඩි කිරීමට තීරණය කර ඇත. දැනට පවතින පළමුවන අඟලට රු. 10 ක් සහ වැඩිවන සෑම අඟලක් සඳහා රු. 5 බැගින් අයකරනු ලබන ගාස්තුව වෙනුවට, 1962 ජූලි මස 16 වෙනි දින සිට වෙළඳ ලකුණු දැන්වීම් හැර අන් සියළුම දැන්වීම් සඳහා තනි තීරුවේ සෑම අඟලකට හෝ ඉන් කොටසකට රු. 10 බැගින්ම අයකරනු ලබන බව සෑම දෙනාගේම දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1962, ජූනි මස 29 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

1962 අංක 259

ඒ. 337/59.

සහකාර නීති කෙටුම්පත්කරු පර්සි ද සිල්වා මහතා 1962 අප්‍රේල් මස 20 වැනි දින සිට නීති කෙටුම්පත්කරු ලෙස.

ඒ. 156/60.

1961 මාර්තු මස 27 වැනි දින සිට නියෝජ්‍ය කම්කරු කොමසාරිස් එන්. එල්. අබේවීර මහතා කම්කරු කොමසාරිස් ලෙස.

ඒ. 27/62.

1962 අප්‍රේල් මස 1 වැනි දින සිට ඩබ්ලිව්. ඇල්. ටී. ද අල්විස් මහතා සත්වෝද්‍යාන අධ්‍යක්ෂ ලෙස.

ඒ. 131/62.

1962 මාර්තු මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සිවිල් සේවක ආචාර්‍ය ඒ. ඩබ්ලිව්. පී. ගුරුගේ මහතා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ලෙස වැඩ බැලීමට.

ඒ. 131/62.

1962 ජූනි මස 1 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂක බී. එම්. හෙට්ටිආරච්චි මහතා නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

සී. ජ. වල්පිට,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 ජූනි මස 25 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍යාලයේ දී ය.
තැ. පෙ. 500.

6-1338/2

---

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

1962 අංක 260

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය

අංකය : ජේඒ. 23/48.

එන්. සිවඥණසුන්දරම් මහතා ඔහුගේ වෙනත් රාජකාරීවලට අතිරේක වශයෙන් 1962 ජූලි 7 වැනි දින සිට, යාපනෙ දිස්ත්‍රික් උසාවියේ අංක. 1385 දරණ නඩුව අවසාන වන තුරු ඇහීමට හා තීන්දුව දීමට, යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය ; ජේඒ. 20/48.

එස්. එස්. කුලතිලක මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 ජූනි 20 වැනි දින සිට, ගම්පහ මහෙස්ත්‍රාත් උසාවියේ අංක. 63390/ඒ දරණ නඩුවේ තීන්දුව දීමට, ගම්පහ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා ගම්පහ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 13/48.

එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 ජූනි 23 වැනි දින සිට, දකුණු කොළඹ මහෙස්ත්‍රාත් උසාවියේ අංක. 19084/එන් දරණ නඩුව අවසාන වන තුරු ඇහීමට හා තීන්දුව දීමට, කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 1/57.

එන්. ඩබ්ලිව්. දිසානායක මහතා 1962 ජූනි 11 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු කොළඹ, අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, කොළඹ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, දෙහිවල-ගල්කිස්ස, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑම්. 7/53.

එම්. ජමීල් මහතා 1962 ජූනි 11 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, අධිකරණ සේවයේ නිලධාරියකු වශයෙන්.

අංකය : ජේඑම්. 2/56 (iii).

ජේ. ජේ. එෆ්. ඒ. ඩයස් මහතා 1962 ජූනි 19 වැනි දින සිට, නැවත නියමයක් කරන තුරු, කුරුණෑගල, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කුරුණෑගල, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා කුරුණෑගල, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 31/48.

ජේ. ජේ. එෆ්. ඒ. ඩයස් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 ජූලි 5 වැනි දින සිට, හඟුරන්කෙත මහෙස්ත්‍රාත් උසාවියේ අංක. 186 හා 187 දරණ නඩු අවසාන වන තුරු ඇහීමට හා තීන්දු දීමට හා 1962 ජූලි 11 වැනි දින සිට, මහනුවර මහෙස්ත්‍රාත් උසාවියේ අංක 27232 දරණ නඩුවද අවසාන වන තුරු ඇහීමට හා තීන්දුව දීමට, මහනුවර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 68සී/51.

සී. වී. උඩලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. ජයවික්‍රම මහතා 1962 ජූනි 15 වැනි, 29 වැනි හා 30 වැනි දිනයන්හි, අනුරාධපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, ත්‍රිකුණාමලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ත්‍රිකුණාමලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 1සී/53.

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සී. කනගසිංහම් මහතා 1962 ජූනි 29 වැනි හා 30 වැනි දිනයන්හි, ත්‍රිකුණාමලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලෙ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, අනුරාධපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා අනුරාධපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඒ. 14/48.

ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1962 ජූනි 23 වැනි දින සිට, කොළඹ ඒකාබද්ධ මහෙස්ත්‍රාත් උසාවියේ අංක, 23905 දරණ නඩුව අවසාන වන තුරු ඇහීමට හා තීන්දුව දීමට, කොළඹ කොටුවේ පිහිටි උසාවියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා කොළඹ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 40/48.

එස්. පී. විජේතිලක මහතා 1962 අගෝස්තු 21 වැනි දින සිට, මාතලේ දිස්ත්‍රික් උසාවියේ අංක එම්. ආර්. 1415 දරණ නඩුව අවසාන වන තුරු ඇහීමට හා තීන්දුව දීමට, මාතලේ පිහිටි උසාවියේ ක්‍රියා කරන පිණිස, මහනුවර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 58ඒ/59.

බී. සේනාරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ටී. ආසීර්වාදම් මහතා 1962 ජූනි 25 වැනි දින සිට 27 වැනි දින දක්වා රත්නපුරේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා රත්නපුරේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 35බී/61.

ඩී. ඩබ්ලිව්. කේ. ලද්දුවහෙට්ටි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1962 ජූනි 25 වැනි දින, කොළඹ, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා කොළඹ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 52ඒ/60.

බී. එස්. සී. රත්වත්තේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. එම්. එම්. තාහීර් මහතා 1962 ජූනි 28 වැනි දින, ගාල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, ගාල්ලේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, හා ගාල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 34/48.

සී. එච්. උඩලාගම මහතා 1962 ජූලි 7 වැනි දින සිට, කෑගල්ලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක. 41096 දරණ නඩුව අවසාන වන තුරු ඇහීමට හා තීන්දුව දීමට, කෑගල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා කෑගල්ලේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 63ඒ/58.

ජේ. ජී. එල්. සුවාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. ජී. ද සිල්වා මහතා, 1962 ජූනි 23 වැනි දින, අවිස්සාවේල්ලේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේ එල්. 41ඒ/60.

එස්. ජේ. එම්. ජී. එස්. මුදන්නායක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඩබ්ලිව්. ද සිල්වා මහතා 1962 ජූනි 23 වැනි දින, කළුතර, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා කළුතර, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේ.එල්. 16සී/59.

ඩී. ඊ. ධර්මසේකර මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එල්. ද සිල්වා මහතා 1962 ජූනි 21 වැනි දින, බලපිටියේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා බලපිටියේ, අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 54ඒ/58.

එල්. සමරතුංග මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එල්. ද සිල්වා මහතා 1962 ජූලි 2 වැනි දින සිට 6 වැනි දින දක්වා, බලපිටියේ අතිරේක දිස ත්‍රික් නඩුකාර ධුරයට, හා බලපිටියේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : පිඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සීමාම්පිල්ලේ මහතා 1962 ජූනි 30 වැනි දින සිට 1962 ජූලි 5 වැනි දින දක්වා, මන්නාරමේ, අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා මන්නාරමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පිඑල්/ඊ. 1/48.

එම්. එහෙම්පරනාදන් මහතා නැති අතර, වී. ආර්. සත්චිත්තානන්දන් මහතා 1962 ජූලි 9 වැනි දින, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, කඩ්ඩුකුලම් හා තම්පලකාමම් පත්තුවල ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පිඑල්/එස්. 7/49.

කේ. සින්නතම්බි මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. සීමාම්පිල්ලේ මහතා 1962 ජූලි 2 වැනි හා 4 වැනි දිනයන්හි, මන්නාරම් දිස්ත්‍රික්කයේ මන්නාරම ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පිඑල්/එච්. 6/61.

පී. බී. හේරත් මහතා නැති අතර, වැලිමඩ ගම්බද උසාවියේ අංක 1058 දරණ නඩුව ඇහීමට අතිරේක වශයෙන් 1962 ජූනි 27 වැනි දින, වී. පී. අබේවික්‍රම මහතා බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ හා වැල්ලවාය ගම්බද උසාවි සභාපති ධුරයේ, වැඩ බැලීමට.

අංකය : පිඑල්/එච්. 6/61.

පී. බී. හේරත්. මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ඒ. හසාන්තලි මහතා 1962 ජූනි 23 වැනි හා 25 වැනි හා 26 වැනි දිනයන්හි, බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ හා වැල්ලවාය ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පිඑල්/ආර්. 5/61.

සී. ආර්. රාජසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එස්. සිවප්‍රගාසම් මහතා 1962 ජූනි 29 වැනි හා 30 වැනි දිනයන්හි හා 1962 ජූලි 2 වැනි දින සිට 5 වැනි දින දක්වා, මඩකලපු දිස්ත්‍රික්කයේ, ඒරාවූර් කෝරලේ, බින්තැන්න පත්තුවේ හා උතුරු මාන්මුනේ පත්තුවේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 ජූනි 22 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කායඝාලය,
තැ. පෙ. අංකය-573,
කොළඹ-12.

6-1217

# වෙනත් පත්කිරීම් ආදිය

1962 අංක 261

115 වැනි පරිච්ඡේදයේ මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපණතේ 14 (1) වැනි වගන්තිය යටතේ කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ අධිකරණ කොට්ඨාශයට අයත් කොළඹ නගර සහා කොට්ඨාශයන්වූ කොම්පඤ්ඤ වීදිය, හුණුපිටිය, වැකන්ද, කුරුඳුවත්ත, කොල්ලුපිටිය, බම්බලපිටිය, හැව්ලොක්ටවුම, තිඹිරිගස්යාය, වැල්ලවත්ත උතුර සහ වැල්ලවත්ත දකුණ, කෝට්ටේ පාරේ පිහිටි සවදේශ වෛද්‍ය විද්‍යාලයට ආසන්න සථානයක සිට බත්තරමුල්ල, තලන්ගම උතුර, මාලබේ, හෝකන්දර, අතුරුගිරිය, පනාගොඩ, ගොඩගම සහ මීගොඩ යන ගම් පසුකොට පාදුක්ක දක්වා විහිදී ඇති ප්‍රසිද්ධ පාරට දකුණෙන් පිහිටි ප්‍රදේශ ඇතුලත් අධිකරණ කොට්ඨාශයේ අංක 761 හා 762 දරණ නඩු අසා විනිශ්චය කරනුවස් කොළඹ මරදානේ අංක 233 දරණ සථානයේ පදිංචි ඒ. ආර්. මොහමඩ් රසින් මහතා විශේෂ ක්වාසි වශයෙන් පත්කරන්ට යෙදුනා ඇත.

ඇම්. ජේ. පෙරේරා,
කර්මාන්ත, සවදේශ හා සංස්කෘතික කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ සථාවර ලේකම්.

1962 ජූනි මස 14 වැනි දින,
කොළඹදීය.

6-1111

## දැන්වීමයි

1962 අංක 262

අදිකාරි අප්පුහාමිල්ලාගේ ධම්සේන කරුණාරත්න විජයතිලක අදිකාරි (මීට ඉහතින් අදිකාරි අප්පුහාමිල්ලාගේ ධම්සේන කරුණාරත්න අදිකාරි නම් දූරු) මහතා අලව්වේ වාසසථානය සහ කායඝාලයද නාරම්මල අතුරු කායඝාලයද ඇතුව කුරුණෑගල අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් ඔප්පු ලියන නොතාරිස් කෙනෙකු වශයෙන් කම්මාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත්කර තිබේ.

ඇම්. ජේ. පෙරේරා,
කම්ාන්ත, සවදේශ සහ සංස්කෘතික කටයුතු
පිළිබඳ අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1962 ක්වූ ජූනි මස 6 දින,
කොළඹ දීය.

6-1198

# ආණ්ඩුවේ නිවේදන

අංක : සී. 5/62.

ඇල්.ඩී.—සී 129/47.

## 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජාඥාව

### 61 වන වගන්තිය යටතේ ආඥාව

1946, ලංකා (ආණ්ඩුක්‍රම) රාජාඥාවේ 61 වන වගන්තිය යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවන ලද ආඥාව.

සී. ජ. වල්පිට,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 ජූනි මස 22 වැනි දින
කොළඹ දීය.

අංක 146 දරණ ආඥාව

වර්ෂයකට විශ්‍රාම වැටුප් හිමි වේතන රු. 2,700 ට වැඩි නො වන හෝ විශ්‍රාම වැටුප් අහිමි වේතන රු. 3,180 ට වැඩි නො වන, මීට අමුණා ඇති උප ලේඛනයේ 1 වන තීරුවෙහි දක්වෙන කැලෑ දෙපාර්තමේන්තුවේ යම් නිලධාරියකුට තරවටු කිරීමේ හෝ සහතික වැටුපට වැඩි නොවන දඩයක් පැනවීමේ බලය, එම උප ලේඛනයේ 2 වන තීරුවෙහි අනුරූප සටහනේ දක්වෙන නිලධාරීන්ට, පහත සඳහන් කොන්දේසිවලට යටත්ව, මින් පවරා දෙනු ලැබේ.

ඒ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කළ හැකි උපදෙස් අනුව එම බලතල ක්‍රියාවේ යෙදවිය යුතුය.

බී. එවැනි නිලධාරියකුට මේ ආඥාව යටතේ පවරනු ලැබූ බලතල අනුව නිලධාරියකු විසින් කරනු ලැබූ තීරණය පිළිබඳව තෘප්තිමත් නොවූ ඕනෑම කෙනකුට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ආයාචනයක් ඉදිරිපත් කළ හැකිය.

සී. නිලධාරියකුට පවරනු ලැබූ දඬුවම් දීමේ බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ක්‍රියාවේ යෙදවිය යුතු යයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී, එම බලතල ඒ නිලධාරියා විසින් එම අවස්ථාවේදී ක්‍රියාවේ යෙදවීම නොකළ යුතුය.

2. මේ නියෝගයේ සඳහන් කිසිවක්, 1946 ලංකා (ආණ්ඩුක්‍රම) රාජාඥාවේ 61 වන වගන්තියෙන් පැවරුණු රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ආයාචනය කිරීමේ අයිතිය අඩු කරන බව හෝ ඒ ගැන කිසිම අයුරකින් බලපාන බව නොසැලකිය යුතුය. නැතහොත් එලෙස තේරුම් නොගත යුතුය.

3. 1959 ජූලි 24 දින අංක 11,814 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ අංක 121 දරන ආඥාවෙන් අන්තිම වරට සංශෝධනය කරනු ලැබ, 1958 අගෝස්තු 1 වන දින අංක 11,465 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ අංක 112 දරන ආඥාවෙහි උප ලේඛනය, දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් වූ කරුණු අතහැරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

## උපලේඛනය

### 1 තීරුව

සාමාන්‍ය ලිපිකරු සේවයේ විධායක ලිපිකරු පංතියේ 2 වැනි ශ්‍රේණියේ හා සාමාන්‍ය ලිපිකරු පංතියේ නිලධාරීහු,
අර්ධ ලිපිකරු සේවයේ නිලධාරීහු,
දිස්ත්‍රික් ලිපිකරු සේවයේ නිලධාරීහු,
තාවකාලික ලිපිකරුවෝ,
ලඝුලේඛක සේවයේ නිලධාරීහු,
යතුරු ලියන්නන්ගේ සේවයේ නිලධාරීහු,
සැලසුම්කරුවෝ,
තාවකාලික යතුරු ලියන්නෝ,
ආධුනික සැලසුම්කරුවෝ,
භාෂා පරිවර්තක,
කාර්මික සහකාර,
අඩවි වන නිලධාරීහු,
සහකාර අඩවි වන නිලධාරීහු,
ප්‍රධාන වන රක්ෂකයෝ,
වන රක්‍ෂකයෝ,
නිරවද්‍යතා නීරක නිළධාරීහු,
ගබඩා භාරකරුවෝ,
සහකාර ගබඩාකරුවෝ,
ලිපිකරු බඩු ගබඩාකරු,
බඩු ගබඩාකරුවෝ,
ක්‍රියාකරවන අධිකාරි,
පෝර්මන්,

උදුනේ පදම් කිරීම භාර නිළධාරි,
පුස්තකාලයාධිපති-කිව්රේටර්
ඡායාරූප ශිල්පී විද්‍යාගාර සහායක,
කාර්මික බඩු ගබඩාකරු,
ටැලිපෝන් ඔපරේටර්,
අනුපිටපත් යතුරුකරු,
පොත් බඳින්නා,
මුරකරුවෝ,
ගබඩා මුරකරුවෝ,
වැවිලි මුරකරුවෝ,
වන මුරකරු
මුරකරු/කම්කරුවෝ,
සයිකල් ඕඩර්ලි,
ආරච්චි,

කාර්යාල කාර්ය සහායක,
ජීප් රියැදුරා,
ලොරි රියැදුරා,
ජෙනරේටර් ක්‍රියාකරවන්නා,
දොඹකර ක්‍රියාකරවන්නා,
ට්‍රැක්ටර් ක්‍රියාකරවන්නා,
යාන්ත්‍රික ක්‍රියාකරවන්නා,
සහකාර යාන්ත්‍රික ක්‍රියාකරවන්නා,
ට්‍රැක් රියැදුරු,
කාර්මිකයා,
ලී වැඩ යාන්ත්‍රිකයා
ලී මෝල් යාන්ත්‍රිකයා
වඩු කාර්මික,

ලී ඔපදමන පින්තාරුකරු,
විදුලි ශිල්පී,
බොයිලේරුකරු,
බොයිලේරු සේවක ශිල්පියා,
කියත් සකසුවෝ,
ඉරුම් කරුවෝ,
ඕවර්සියර්වරු,
ගබඩා ඕවර්සියර්වරු,
වැඩබිම් ඕවර්සියවරු
වැවිලි ඕවර්සියර්වරු,
වන ඕවර්සියර්වරු,
කාර්යාල කම්කරු,
ලී ගබඩා කම්කරු,
වැවිලි කම්කරු,
නවාන් කම්කරුවෝ,
කසල ශෝධක කම්කරු හා උයන් ගොව්වා,
ලොරි ශෝධකයෝ,
සංචාරක බංගලාකරුවෝ,
විද්‍යාගාර සේවක,
ග්‍රීස් ගසන්නා,
අරක්කැමියා,

### 2 තීරුව

ජ්‍යෙෂ්ඨ සහකාර වන සංරක්ෂකවරු,
සහකාර වන සංරක්ෂකවරු,
කණිෂ්ඨ සහකාර වන සංරක්ෂකවරු,
පාලන සහකාර,
ගණකාධිකාරි,
දැව පාවිච්චිය පිළිබඳ පර්යේෂන නිලධාරි.
පර්යේෂණ සහකාර,
වන ඉංජිනේරු,

6—1341

---

ඇල්.ඞී.—බී. 97/41.

අංකය : පී. ඇන් 1103/31.

## විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා

1948 අංක 13 දරන විශ්‍රාම වැටුප් (සංශෝධන) පනතින් සංශෝධිත 1934 පෙබරවාරි 5 වෙනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවන්හි 51 වෙනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,,
මුදල් ඇමති.

1962. 6. 19,
කොළඹ.

### නිවේදනය

1. කලින් කල සංශෝධනය කරනු ලැබූ පරිදි, 1934 පෙබරවාරි 5 වෙනි දින දරන විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා. එහි 2 අ (1) වෙනි වගන්තියෙහි (IV) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන්, තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(IV) විකල වූ සිහියෙන් යුක්ත වූ, හෝ අසනීපයක් හෝ තුවාලයක් හේතු කොට ගෙන සිහි කල්පනාවෙන් යුක්ත ව තෝරා ගැනීමක් කිරීමෙහි අපොහොසත් තත්ත්වයට පමුණුවනු ලැබූ නිලධරයකු සම්බන්ධයෙන් වූ විට, මේ උපවගන්තියේ පූර්වෝක්ත විධිවිධානයන්හි සඳහන් තෝරා ගැනීමේ බලය සවකීය අභිමතය පරිදි භාණ්ඩාගාරයේ ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමේ තැනැත්තකු විසින් ඒ නිලධරයා වෙනුවෙන් පාවිච්චි කළ හැකිය".

2. මේ නිවේදනයේ 1 වෙනි ඡේදය මගින් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවන්හි කරනු ලැබූ සංශෝධනය 1962 ජනවාරි 1 වෙනි දිනයෙහි ක්‍රියාත්මක වී ඇතැයි සැලකිය යුතුය.

6-1236

---

## 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනත

### ආඥාව

1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 වෙනි වගන්තියේ 1) හා (8) වෙනි උප වගන්තිවලින් හා 4 වෙනි වගන්තියේ 1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පරිදි, ‍ධිකරණ අමාත්‍ය සැමුවෙල් පීටර් ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු වන මම, මෙයින්—

(අ) පහත සඳහන් තැනැත්තන් කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි යටිගහ ගම් ප්‍රදේශය සඳහා සමන්විත සමගි මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් පත්කරමි.

(1) බලගල්ල පදිංචි නාරද ජයකොඩි මහතා,
(2) කල්එළිය පදිංචි විතාන පැල්පිට කෝරලාගේ චන්ද්‍රරත්න මහතා,
(3) කොටදෙනියාව පදිංචි කාංග පතිරන්නැහෙලාගේ චාර්ලිස් අප්පුහාමි මහතා,
(4) බාඳුරාගොඩ පදිංචි මුදන්නායක අප්පුහාමිලාගේ පවුලස් පෙරේරා මහතා,
(5) කොටදෙනියාව පදිංචි නයිනායක පතිරන්නැහෙලාගේ විජේසිංහ මහතා,
(6) කොටදෙනියාව පදිංචි ඩී. පී. සුබසිංහ මහතා,
(7) කල්එළිය පදිංචි ස්මයිල් මරික්කාර් මුෂින් මරික්කාර් මහතා,
(8) පල්ලේවෙල පදිංචි මුදියන්සෙ පීරිස්ලාගේ ජයතිස්ස මහතා,
(9) පල්ලේවෙල පදිංචි රත්නිලකගේ අමරසිංහ මහතා,
(10) කිතුල්වල පදිංචි මුතුගල්පේඩිගේ සිරිවර්ධන මහතා.
(11) හල්පෙ පදිංචි ඩබ්ලිව්. ඒ. එම්. බී. ඩබ්ලිව්. ඒකනායක මහතා,

(12) වත්තමුල්ල පදිංචි අතාවුද අච්චිතලම්මහර ලේකම්ලාගේ ජිනදාස මහතා,

(13) මඩිතියවල පදිංචි ගනිහි අච්චි කංකානමලාගේ අබේසිංහ මහතා,

(14) රස්සපාන පදිංචි රස්සපාන අප්පුහාමිල්ලාගේ සයිමන් අප්පුහාමි මහතා,

(15) බලගල්ල වත්ත පදිංචි රාජසිංහ ලංකාතිලක ජයකොඩි මහතා,

(16) හෙට්ටිමුල්ල පදිංචි අතාවුද සිවුපතිරත්නගේ සිරිවර්ධන මහතා,

(17) නාවාන පදිංචි මුතුකුට්ටි ආරච්චිගේ පීරිස් මහතා,

(18) පරගොඩ පදිංචි නයිනායක පතිරන්නැහෙලාගේ නන්දසේන මහතා,

(19) මක්කානිගොඩ පදිංචි ජී. ආර්. හරමානිස් මහතා,

(20) කල්එලිය පදිංචි ජයලත් රාලලාගේ පියදාස මහතා,

(21) පල්ලේවෙල පදිංචි කුමාරවිදානලාගේ ගුණරත්න මහතා,

(22) දොලහේන පදිංචි එම්. ආර්. චාර්ලිස් මහතා,

(23) බොකලගම—පැලපිටිගම පදිංචි මාරසිංහ පේඩිගේ නන්දසේන මහතා,

(24) මුද්දරගම පදිංචි සේනාදිරි දුමුන්නගේ ගුණසේකර මහතා,

(25) ඉදිපරපේ පදිංචි ජයසිංහ එල්ලක්කල අප්පුහාමිල්ලාගේ ධර්මසේන මහතා,

(26) හල්පෙ පදිංචි හෙරත් රාලලාගේ පොඩිසිංඤෝ පෙරේරා මහතා,

(27) කලුඅග්ගල පදිංචි ජේ. ජී. ඒ. කරුණාරත්න මහතා,

(28) කල්එලිය පදිංචි ඩබ්ලිව්. කේ. මෙතියස් සිංඤෝ මහතා.

(ආ) ඉහතකී මණ්ඩලයේ සභාපති වශයෙන් බලගල්ල පදිංචි නාරද ජයකොඩි මහතා, පත්කරමි ; තවද,

(ඇ) එබඳු එක් එක් සාමාජිකයා නිලය දැරිය යුතු කාලසීමාව, මේ ආඥාව ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දින සිට අවුරුදු 2ක් විය යුතුයයි නිශ්චය කරමි.

සෑම් පී. සී. ප්‍රනාන්දු,
අධිකරණ අමාත්‍ය.

1962 ජූනි මස 21 දින,
කොළඹ දී ය.

6-1328

---

## 1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනත

### ආඥාව

1958 අංක 10 දරණ සමගි මණ්ඩල පනතෙහි 3 වෙනි වගන්තියේ (1) හා (8) වෙනි උප වගන්තිවලින් හා 4 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පරිදි, අධිකරණ අමාත්‍ය සැමුවෙල් පීටර් ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු වන මම, මෙයින්—

(අ) පහත සඳහන් තැනැත්තන් කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර සියනෑකෝරලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි මෙගොඩපොත ගම්ප්‍රදේශය සඳහා සමන්විත සමගි මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් පත්කරමි :—

(1) මීවිටිගම්මන පදිංචි මුහන්දිරම් ධම්සේන අලගියවන්න මහතා.

(2) ගොඩගම පදිංචි විතාන පැල්පිට කෝරාලලාගේ සිමියොන් ජයවර්ධන මහතා.

(3) පල්කුඹුර පදිංචි විතාන පතිරන්නැහෙලාගේ දාවිත් මහතා.

(4) අලවල පදිංචි මලවිගේ පීටර් සිංඤෝ මහතා.

(5) කරස්නාගල පදිංචි වනිගසූන්දර අප්පුහාමිල්ලාගේ දොන් පීටර් අප්පුහාමි මහතා.

(6) අරුප්පස්ස පදිංචි රාජපක්ෂ අප්පුහාමිල්ලාගේ ගුණසේකර මහතා.

(7) කහටඹිට පදිංචි ස්මයිල් මහමුත් මොහමඩ් මන්තිවම් මහතා.

(8) පරනගම පදිංචි රාජකරුණා වීරසිංහ මහතා.

(9) ඕපන්ඇල්ල පදිංචි එදිරිසිංහ ආරච්චිගේ වෙලුන් සිංඤෝ මහතා.

(10) වල්ගම්මුල්ල පදිංචි අබේකුල රාජපක්ෂ පතිරන්නැහැලාගේ දොන් සෙනෝරිස් රාජපක්ෂ මහතා.

(11) බෝපාගම පදිංචි කාරියවසම් වික්‍රම ආරච්චිගේ බ්‍රම්පි අප්පුහාමි මහතා.

(12) කුරවලාන පදිංචි සමරකෝන් බත්වඩන රාලලාගේ දොන් පීරිස් සමරකෝන් මහතා.

(13) බෝපැත්ත පදිංචි දොන් එලියෙස් රාජපක්ෂ මහතා.

(14) ඌරාපොල පදිංචි දොන් රොබට් සෙනවිරත්න මහතා.

(15) මඩකොටුව පදිංචි වන්නි ආරච්චි අප්පුහාමිලාගේ අමරතුංග මහතා.

(16) කුරුවමුල්ල පදිංචි කොඩිකාරගේ පෙමියානු විජේසිංහ මහතා.

(17) බෙරලන්න පදිංචි එදිරිතිලක පේඩිගේ ජයසේන මහතා.

(18) පැල්පිට පදිංචි කරුණාපේඩිගේ ගුණසේන මහතා.

(19) වරාගොඩ පදිංචි ගාර්දිවසන් වෛද්‍යතිලකගේ පේමදාස මහතා.

(20) වැලිකඩමුල්ල පදිංචි වික්‍රම අච්චිගේ මෙතියස් සිංඤෝ මහතා.

(21) යටවක පදිංචි ජේ. ඒ. ජෝන් සිංඤෝ මහතා.

(22) නාගොඩ පදිංචි ආර්. පී. ඒමිස් සිංඤෝ මහතා.

(23) ලාඋළුපිටිය පදිංචි ඉලන්දාරි පේඩිගේ පීටර් මහතා.

(24) හප්පිටිය පදිංචි විතාන පතිරන්නැහෙලාගේ එවුදියස් සිංඤෝ මහතා.

(25) රතඹලේ පදිංචි රත්නායකගේ සේතන් සිංඤෝ මහතා.

(26) මීගල්ල පදිංචි දොන් සාපින් රාජකරුණා මහතා.

(ආ) ඉහතකී මණ්ඩලයේ සභාපති වශයෙන් මීවිටිගම්මන පදිංචි මුහන්දිරම් ධම්සේන අලගියවන්න පත්කරමි ; තවද,

(ඇ) එබඳු එක් එක් සාමාජිකයා නිලය දැරිය යුතු කාලසීමාව මේ ආඥාව ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දින සිට අවුරුදු දෙකක් වියයුතු යයි නිශ්චය කරමි.

සෑම් පී. සී. ප්‍රනාන්දු,
අධිකරණ අමාත්‍ය.

1962 ජූනි මස 20 වෙනි දින,
කොළඹ.

6-1327

---

ඇල්. ඩී.—බී.80/44

## පඩි පාලක සභා ආඥපනත

### නිවේදනයයි

පඩිපාලක සභා ආඥපනතේ (136 වැනි පරිච්ඡෙදය) 20,23, 24 සහ 25 වන වගන්ති යටතේ, ගුදිරි කොහු හා ඇටකෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව විසින් ඇතිකරන ලදුව මීට යාව ඇති උපලේඛනයෙහි දක්වා ඇත්තාවූ තීරණයන් ගරු කම්කරු හා ජනසතු සේවා ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී ආඥපනතේ 29(3) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ තීරණයෝ 1962 ජූලි මස 1 වැනි දින වලංගු බවට පැමිණෙති.

වී. ඇස්. ඇම්. ද මැල්,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයා.

1962 ජූනි මස 25 වැනි දින, කොළඹ දීය.

### උපලේඛනය

### I වන කොටස

#### 20 (2) (බී) වන වගන්තිය යටතේ විධානය

(1) කම්කරු කොමසාරිස්වරයා විසින් විශේෂ දීමනාව ගණන් බලා මාස්පතා ප්‍රසිද්ධ කළ යුතුය

(2) කොයියම්ම මාසයක වුවත් වැඩ කරන සාමාන්‍ය දවසකට ගෙවිය යුතු විශේෂ දීමනාව ගණන් බැලිය යුත්තේ එම මාසයට ප්‍රථම ගත්වූ මාසය සඳහා වූ ජීවන වියදම් අංකය පදනම් කරගෙනය

වැඩ කරන සාමාන්‍ය දවසක් යන්නෙහි අර්ථ නිරූපණය (24 වන වගන්තිය)

වැඩ කරන සාමාන්‍ය දවසකට අයත් පැ ගණන (කෑම වේලකට පැයක් ඇතුළුව) වනාහි—

| | |
|---|---|
| සෙනසුරාද නොවන දවසකට | 9 කි |
| සෙනසුරාදවකට | 7 කි |

## II වන කොටස

ගුදිරි කොහු සහ ඇටකෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තයේ කටයුතුවල ඇතැම් කාර්යයන්ට අදල වන්නාවූ කැලි මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අඩුම වේතන ප්‍රමාණයන් මෙසේය :—

| කාර්යය | ප්‍රමාණය | රු. ශ. | |
|---|---|---|---|
| ඇටකෙඳි කොහු අර්ධවශයෙන් හෝ සම්පූර්ණයෙන් අතින්පිරීම සහ "බැමිතුනේ" සම්මත අත්මිටිවලට බැඳීම (එනම් පිටරටයැවීම සඳහා සකස් කිරීම) ... ... ... ... ... | හොණ්ඩරයකට | 8 75 | බැගින් |
| ඇටකෙඳි කොහු අර්ධවශයෙන් හෝ සම්පූර්ණයෙන් අතින් පිරීම සහ "බැම්දෙකේ" සම්මත අත්මිටිවලට බැඳීම (එනම් පිටරට යැවීම සඳහා සකස්කිරීම) ... ... ... ... ... | එම ... | 8 25 | බැගින් |
| පාට කිරීම සඳහා පිළියෙල කිරීම් වශයෙන් අත්මිටිවලට නොබැඳ අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් අතින් පිරීම (එනම් පිටරට යැවීම සඳහා සකස්කිරීම) ... ... ... ... ... | එම ... | 4 12 | බැගින් |
| පාට කරන ලද ඇටකෙඳි කොහු අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් අතින් පිරීම සහ අත්මිටිවලට බැඳීම (එනම් පිටරට යැවීම සඳහා සකස් කිරීම) ... ... ... ... ... | එම ... | 9 25 | බැගින් |

## III වන කොටස

කාලම්මිමේ වැඩ වලට ගෙවන අඩුම වේතන ප්‍රමාණයන් පහත දක්වා ඇති පරිදි වූ—

(I) මූලික ප්‍රමාණයකින් සහ

(2) විශේෂ දීමනාවකින් ද යුක්ත වේ—

| (1)<br>කම්කරුවාගේ පන්තිය | (2)<br>වැඩකරන සාමාන්‍ය දවසකට මූලික ප්‍රමාණය | (3)<br>කවර මාසයක වුව වැඩ කරන සාමාන්‍ය දවසකට ගෙවිය යුතු විශේෂ දීමනාවේ ප්‍රමාණය<br>(ඒ)<br>ගතවූ මාසයේ ජීවන වියදම් අංකය 100·1 නම් විශේෂ දීමනාව වන්නේ— | (බී)<br>ගතවූ මාසයේ ජීවන වියදම් අංකය 100·0 නම් විශේෂ දීමනාව වන්නේ— | (සී)<br>ගතවූ මාසයේ ජීවන වියදම් අංකය 100.1 ට වැඩිවූ විට හෝ 100·0ට අඩුවූ විට එය 100·1ට ඉහළ ගෙනයන හෝ 100·0ට පහළ ගෙන යන හෝ සෑම අංක 1·8ටේ සම්පූර්ණ ඒකකයකට (ඒකකයේ ඛන්ඩ ගණන් ගනු නොලැබේ) පහත දක්වෙන ප්‍රමාණයන් අනුව පිළිවෙළින් මෙහි පහත 1 වන හා 2 වන චක්‍රයන්හි නිදර්ශිත පරිද්දෙන් ගණන් බලා එන මුදලකින් උචිත පරිද්දෙන් මීට ප්‍රථම 3(ඒ) තීරයේ නියමිත විශේෂ දීමනාවේ ප්‍රමාණය වැඩිකළ යුතු හෝ 3(බී) තීරයේ නියමිත විශේෂ දීමනාවේ ප්‍රමාණය අඩු කළ යුතු හෝ වන්නේය |
|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| ඒ. (වයස අවුරුදු 18ට නොඅඩු) පිරිමි කම්කරුවෝ : | | | | |
| (ඒ) II වැනි ශ්‍රෙණිය— | | | | |
| ලොරිවලින් හෝ කරත්තවලින් ගබඩාවලට ඇටකෙඳි කොහු භාර ගැනීම, බැලස් සහ මිටි ගණන් කිරීම, බැලස් සහ මිටිවල බර කිරීම; කොහු තේරීම; බැලස් සහ මිටි අට්ටි ගැසීම; බැලස් සහ මිටි අට්ටි කැඩීම; බැලස් සහ මිටි ලිහීම; අනවශ්‍ය දේ අස් කිරීම සහ ශුද්ධ කිරීම; අවුල් කොහු මිටි කර බැඳීම; අවුල් කොහු වේලීම; බැලස් සහ මිටි ගබඩාවේ එක් අංශයක සිට තවත් අංශයකට ගෙන යාම; කැපූ ඇට කෙඳි අත්මිටිවල අස්කොන් කැපීම ; ඇඹරූ කොහු සුළි දැමීම ; බැලස් කිරීම හෝ දරණු ගැසීම ; පාට පෙවීම සඳහා දර කැපීම ; පිරීම සඳහා තෙල් දීම; ඇට කෙඳි බැමි කැපීම ; ගබඩා සහ කාණු පිස දැමීම ; කොහු බත් සහ කුණු රොඩු කරත්තවල පටවා ඉවතට ගෙනයාම ; ඉවතටගෙනයාම සඳහා කොහු බත් සහ කුණු රොඩු වාහනවල පැටවීම ; කොහු බත් හැලීම ; කොහු බත් සහ කුණු රොඩු ගෝනි කිරීම : තේ පිළියෙළ කිරීම ; තේ සහ කෑම බෙදීම ; කොහු පැක් කිරීමේදී සහ සකස් කිරීමේදී පාවිච්චිවන විවිධ ද්‍රව්‍යයන් භාර ගැනීම ; ගණන් කිරීම ; බර කිරීම ; අඩුක්කිරීම ; ඉවතට ගෙනයාම ; කැපීම සහ පිළියෙළ කිරීම ; බැලස් සහ මිටි ගබඩාවෙන්, දුම්දෙන කූටියෙන් හෝ සායම් පොවන තැනින් බේල් ප්‍රෙස් යන්ත්‍රය කරා ගෙනයාම ; පෙට්ටි කරන්නන් අතට කොහු යැවීම ; ප්‍රෙස් පෙට්ටි වැඩ කිරීම පිණිස වින්ච් ක්‍රියා කරවීම ; උණ බම්බු ඉරීම සහ පැලීම ; වළයම්පටි කැපීම ; කොහු කඹ දිග හැරීම ; ප්‍රෙස්යන්ත්‍රය, තට්ටුව, වළ සහ වටාපිටාව පිස දැමීම සහ ශුද්ධ කිරීම ; බේල් මිටි හන රෙදි වලින් වසා මැසීම ; කඩදසි වලින් හෝ හණ රෙදි වලින් බැලස් එතීම සහ නැවට යැවීම සඳහා බඩු මිටි සියල්ල ලකුණු කිරීම යන වැඩවල යෙදී සිටින කම්කරුවෝ ... ... ... | 1 40 ... | 2 0 ... | 1 97 ... | 0 03 |

| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|
| (බී) මධ්‍යම ශ්‍රෙණිය— බිම් මට්ටමේ තිබෙන කොහු ප්‍රෙස් තට්ටුවට (උසක පිහිටා තිබේ නම්) විසි කිරීම ; ශුද්ධ කිරීමේ යන්ත්‍ර වලට කොහු ඇල්ලීම ; බැලස් පෙට්ටිවල කොහු බැලස් කිරීම ; කොහු ලණු වලින් කොහු කඹ ඇඹරීම ; කොහු වලට ගෙන්දගම් දුම් දමීමේ වැඩ කටයුතු ; ඇට කෙඳි අත්මිටි නියමිත ප්‍රමාණවලට කැපීම සහ කොහු පාට කිරීමේ වැඩ යන වැඩවල යෙදී සිටින කම්කරුවෝ ... ... | 1 60 ... | 2 10 ... | 2 7 ... | 0 3 |
| (සී) I වන ශ්‍රෙණිය— යාන්ත්‍රික ජම්බාර වලින් හෝ වෙනත් ක්‍රම වලින් බේල් පෙට්ටිවලට කොහු ඇහිරීම ; බේල් ප්‍රෙස් යන්ත්‍රය පාලනය කිරීම සහ ක්‍රියා කරවීම ; බේල් මිටි වලයම් පටි වලින් හෝ කඹවලින් වෙලීම ; බේල් අට්ටි ගැසීම ; අට්ටි කැඩීම ; උසුලාගෙන යාම ; ඉවත් කිරීම ; පැටවීම සහ බෑම ; ඇට කෙඳි ඇඹරීම සහ සුලි දැමීම යන වැඩවල යෙදී සිටින කම්කරුවෝ ... ... | 1 80 ... | 2 10 ... | 2 7 ... | 0 3 |
| (ඩී) බේල් කරන යන්ත්‍රයේ ප්‍රධාන ක්‍රියා කරවන්නා ... | 2 0 ... | 2 10 ... | 2 7 ... | 0 3 |
| බී. කම්කරු ස්ත්‍රීන් (වයස අවුරුදු 18ට නොඅඩු) ... | 1 15 ... | 1 88 ... | 1 85 ... | 0 3 |
| සී. වයස අවුරුදු 18ට අඩු (ස්ත්‍රී පුරුෂ භෙදයක් නොමැතිව) කම්කරුවෝ— | | | | |
| අවුරුදු 14ට වැඩි එහෙත් අවුරුදු 15 ට අඩු ... | 0 80 ... | 1 51 ... | 1 49 | 0 2 |
| අවුරුදු 15ට වැඩි එහෙත් අවුරුදු 16ට අඩු ... | 0 90 ... | 1 56 ... | 1 54 | |
| අවුරුදු 16ට වැඩි එහෙත් අවුරුදු 17ට අඩු ... | 1 0 ... | 1 61 ... | 1 59 | |
| අවුරුදු 17ට වැඩි එහෙත් අවුරුදු 18ට අඩු ... | 1 15 ... | 1 71 ... | 1 69 | |

ඉහත 3(සී) තීරයේ දක්වූ විධාන භාවිත කරන අන්දම දක්වන චක්‍ර

## 1 වන චක්‍රය

**ජිවන වියදම් අංකය ඉහළ නැංගවිට ගෙවිය යුතු විශෙෂ දීමනාව**

| | වයස අවු. 18ට නොඅඩු පිරිමි කම්කරුවන් | | අවුරුදු 18ට නොඅඩු කම්කරු ස්ත්‍රීන් | වයස අවුරුදු 18ට අඩු (ස්ත්‍රී පුරුෂ භෙදයක් නොමැතිව) කම්කරුවෝ | | | |
|---|---|---|---|---|---|---|---|
| | II වන ශ්‍රෙණිය | මධ්‍යම ශ්‍රෙණිය 1 වන ශ්‍රෙණිය සහ බේල් කරන යන්ත්‍රයේ ප්‍රධාන ක්‍රියාකරවන්නා | | වයස අවු. 14ට අඩු එහෙත් අවුරුදු 15ට වැඩි | වයස අවු. 15ට වැඩි එහෙත් අවු. 16ට අඩු | වයස අවු. 16ට වැඩි එහෙත් අවු. 17 අඩු | වයස අවු. 17ට වැඩි එහෙත් අවු. 18 අඩු |
| ජිවන වියදම් අංකය | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 100.0—101·8 ... | 2 0 ... | 2 10 ... | 1 88 ... | 1 51 ... | 1 56 ... | 1 61 ... | 1 71 |
| 101.9—103·6 ... | 2 3 ... | 2 13 ... | 1 91 ... | 1 53 ... | 1 58 ... | 1 63 ... | 1 73 |
| 103.7—105·4 ... | 2 6 ... | 2 16 ... | 1 94 ... | 1 55 ... | 1 60 ... | 1 65 ... | 1 75 |
| 105.5—107·2 ... | 2 9 ... | 2 19 ... | 1 97 ... | 1 57 ... | 1 62 ... | 1 67 ... | 1 77 |
| 107.3—109·0 ... | 2 12 ... | 2 22 ... | 2 0 ... | 1 59 ... | 1 64 ... | 1 69 ... | 1 79 |

## 2 වන චක්‍රය

**ජිවන වියදම් අංකය පහළ බැස්ය විට ගෙවිය යුතු විශෙෂ දීමනාව**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 100.0—98·3 ... | 1 97 ... | 2 7 ... | 1 85 ... | 1 49 ... | 1 54 ... | 1 59 ... | 1 69 |
| 98.2—96·5 ... | 1 94 ... | 2 4 ... | 1 82 ... | 1 47 ... | 1 52 ... | 1 57 ... | 1 67 |
| 96.4—94·7 ... | 1 91 ... | 2 1 ... | 1 79 ... | 1 45 ... | 1 50 ... | 1 55 ... | 1 65 |
| 94.6—92·9 ... | 1 88 ... | 1 98 ... | 1 76 ... | 1 43 ... | 1 48 ... | 1 53 ... | 1 63 |
| 92.8—91·1 ... | 1 85 ... | 1 95 ... | 1 73 ... | 1 41 ... | 1 46 ... | 1 51 ... | 1 61 |

## IV වන කොටස

**අතිකාල ප්‍රමාණය**

වැඩ කරන සාමාන්‍ය දවසට වැඩියෙන් වැඩ කරන එක් එක් පැයකට ගෙවිය යුතු අඩුම අතිකාල වැටුප් ප්‍රමාණය වූකලී (අඩුම දෛනික ප්‍රමාණය 8න් බෙදු සොයා ගතයුතු) පැයකට වැටහෙන අඩුම ප්‍රමාණය පැයකට වැටහෙන එම අඩුම් ප්‍රමාණයෙන් සියයට 50කින් වැඩි කළ විට ලැබෙන ප්‍රමාණය වන්නේය.

## V වන කොටස

**සතිපතා නිවාඩුව (24 වගන්තිය)**

සෑම සේව්‍යයෙක් තමා යටතේ සේවය කරන සියලුම කම්කරුවනට එක් එක් ඉරිදු දිනය සතිපතා නිවාඩු දිනය වශයෙන් දිය යුතුය.

එසේද වුවත් පහත සඳහන් නියමයන්ට යටත්ව කවර කම්කරුවකු වුව ද ඉරිදු දිනයක වැඩෙහි යොදවා ගැනීමට සේව්‍යයකුට පුළුවන :—

(1) එබඳු ඉරිදවට පසුව එන සදින ඇතුළත දිනයක් නිවාඩු දිනයක් වශයෙන් ඒ කම්කරුවාට දිය යුතුය:

(2) ඉරිදු දිනයක කරන ලද වැඩ වෙනුවෙන් එම කම්කරුවාට වැඩ කරන සාමාන්‍ය දවසකට අයත් අඩුම වේතනය මෙන් එකහමාරක පරිශ්‍රමිකයක් ගෙවිය යුතු ය; සහ

(3) කිසිම කම්කරුවකු එබඳු ඉරිදවක පැ නවයකට (කෑම වේලක් ගැනීමට පැයක් ඇතුළුව) වඩා වැඩෙහි යොදවා නොගත යුතුය.

යම් කාලසීමාවක සතිපතා නිවාඩු දිනයෙහි දී කරන ලද වැඩ වෙනුවෙන් කම්කරුවකුට ගෙවිය යුතු වන්නාවූ පාරිශ්‍රමිකය ඒ කාලසීමාව සඳහා ගෙවන වේතනයත් සමග ගෙවිය යුතුයි.

## VI වන කොටස

### වාර්ෂික නිවාඩු (25 වන වගන්තිය)

1. (ඒ) වයස අවුරුදු 18ට නොඅඩු පිරිමි කම්කරුවකු යම්කිසි වර්ෂයක් තුළ දී එකම සේව්‍යයා යටතේ සේවයෙහි යෙදී සිට දින 228කට වැඩිපුර වැඩකර තිබේ නම් එසේ දින 228ට වැඩියෙන් වැඩ කළ දින ගණනේ සෑම දින හතරේ ඒකකයකට එක් නිවාඩු දිනයක් බැගින් ගණන් බලා එන නිවාඩු දිනය හෝ දින ගණන ඊළඟ වර්ෂයෙහි දී ඔහුට දිය යුතුය ;

එසේද වුවත් දින 284කට වැඩිපුර වැඩ කළ යම්කාලයක් වේ නම් ඒ වෙනුවෙන් එබඳු කිසි නිවාඩුවක් දීමට සේව්‍යයෙක් බැඳී නැත්තේය.

(බී) කම්කරු ස්ත්‍රියක හෝ වයස අවුරුදු 18ට අඩු (ස්ත්‍රී පුරුෂ භේදයක් නොමැතිව) කම්කරුවකු හෝ යම්කිසි එක් වර්ෂයක් තුළ දී එකම සේව්‍යයා යටතේ සේවයෙහි යෙදී සිට දින 204කට වැඩිපුර වැඩ කර තිබේ නම් එසේ දින 204ට වැඩියෙන් වැඩ කළ දින ගණනේ සෑම දින හතරේ ඒකකයකට එක් නිවාඩු දිනයක් බැගින් ගණන් බලා එන නිවාඩු දිනය හෝ දින ගණන එම සේවකයාට ඊළඟ වර්ෂයේ දී දිය යුතුය ;

එසේද වුවත් දින 260කට වැඩිපුර වැඩ කළ යම් කාලයක් වේ නම් ඒ වෙනුවෙන් එබඳු කිසි නිවාඩුවක් දීමට සේව්‍යයෙක් බැඳී නැත්තේය.

(සී) වයස අවුරුදු 18ට නොඅඩු පිරිමි කම්කරුවකු විසින් යම්කිසි එක් වර්ෂයක් තුළ දී එකම සේව්‍යයාට ඇට කෙඳි කොහු රාත්තල් 9,576කට වැඩි ප්‍රමාණයක් පීරා බැඳ දෙන ලද්දේ නම් රාත්තල් 9,576ට වැඩියෙන් පීරා බැඳ දෙන ලද ඇට කෙඳි කොහු රාත්තල් ගණනේ සෑම රාත්තල් 180වේ ඒකකයකට එක් නිවාඩු දිනයක් බැගින් ගණන් බලා එන නිවාඩු දිනය හෝ දින ගණන ඊළඟ වර්ෂයේ දී එම කම්කරුවාට දිය යුතුය ;

එසේද වුවත් රාත්තල් 12,096කට වැඩියෙන් පීරා බැඳ දෙන ලද යම් ඇට කෙඳි කොහු ප්‍රමාණයක් වේ නම් ඒ වෙනුවෙන් එබඳු කිසි නිවාඩුවක් දීමට සේව්‍යයෙක් බැඳී නැත්තේය.

(ඩී) කම්කරු ස්ත්‍රියක හෝ වයස අවුරුදු 18ට අඩු (ස්ත්‍රී පුරුෂ භේදයක් නොමැතිව) කම්කරුවකු හෝ විසින් යම්කිසි එක් වර්ෂයක් තුළ දී එකම සේව්‍යයාට ඇට කෙඳි කොහු රාත්තල් 8,568කට වැඩි ප්‍රමාණයක් පීරා බැඳ දෙන ලද්දේ නම් රාත්තල් 8,568ට වැඩියෙන් පීරා බැඳ දෙන ලද ඇට කෙඳි කොහු රාත්තල් ගණනේ සෑම රාත්තල් 180වේ ඒකකයට එක් නිවාඩු දිනයක් බැගින් ගණන් බලා එන නිවාඩු දිනය හෝ දින ගණන එම සේවකයාට ඊළඟ වර්ෂයේ දී දිය යුතුය ;

එසේද වුවත් රාත්තල් 11,088කට වැඩියෙන් පීරා බැඳ දෙන ලද යම් ඇට කෙඳි කොහු ප්‍රමාණයක් වේ නම් ඒ වෙනුවෙන් එබඳු කිසි නිවාඩුවක් දීමට සේව්‍යයෙක් බැඳී නැත්තේය.

2. 1 වන ඡේදයෙහි (ඒ) සහ (බී) යන අනුච්ඡේදයන්ගේ කාර්‍ය්‍යයන් සඳහා කම්කරුවකු ''වැඩ කළ දින'' යන්නට පහත සඳහන් දවස් ද ඇතුළත් විය යුතුය :—

(ඒ) සැලකිල්ලට භාජන වී පවත්නා කිසියම් වර්ෂයක පඩිපාලක සහා ආඥපනතේ (136 වැනි පරිච්ඡේදය) 25 වන වගන්තිය යටතේ සේව්‍යයා විසින් කම්කරුවාට දෙන ලද සෑම නිවාඩු දවසක් ;

(බී) සේව්‍යයාගේ අනුමතිය ලද කවර හේතුවක් නිසා හෝ වැඩට නොපැමිණි සෑම දවසක් ;

(සී) සිය රක්ෂාවෙහියෙදී සිටිය දී එයින්ම ඇතිවූ අනතුරකින් කම්කරුවා ලැබූ තුවාලයක් හේතුකොටගෙන වැඩට නොපැමිණි සෑම දවසක් ;

(ඩී) කම්කරුවන් පිළිබඳ ආඥපනතේ (139 වැනි පරිච්ඡේදය) III වන උපලේඛනයේ විස්තර වන කිසියම් වෘත්තිය රෝගයක් නිසා වැඩට නොපැමිණි සෑම දවසක් ;

(ඊ) කම්කරුවාට වැඩ දීමට සේව්‍යයාට නුපුළුවන් වන සෑම දවසක් ;

(එෆ්) නීත්‍යානුකූලවූ වැඩ නැවැත්වීමක් හෝ වැඩෙන් පිටමං කිරීමක් නිසා වැඩට නොපැමිණි සෑම දවසක්. එහෙත් මෙවැනි දවස් ගණන කිසිම වර්ෂයක මුළුමනින් දින 30කට වැඩි නොවිය යුතුය ; සහ

(ජී) පඩි පාලක සභා ආඥපනත හැර වෙන යම්කිසි ග්‍රන්ථාරූඪ නීතියකින් හෝ නීතියක විධිවිධාන යටතේ හෝ කම්කරුවකුට හිමිකම් ඇති සෑම නිවාඩු දවසක් හෝ වැඩට නොපැමිණ සිටිය හැකි සෑම දවසක් ද වේ ; එහෙත් පඩි පාලක සභා ආඥපනතේ 24 වන වගන්තිය යටතේ සතිපතා නිවාඩු දිනය වශයෙන් නියමිත දවස මීට නොඇතුළත්.

3. 1 වන ඡේදයේ (සී) සහ (ඩී) යන අනුච්ඡේදයන්ගේ කාර්‍ය්‍යයන් සඳහා පහත සඳහන් සෑම දිනයක වූ කලී කම්කරුවකු විසින් ඇට කෙඳි කොහු රාත්තලක් 42ක් පීරා බැඳ දෙන ලද්දේ යැයි සැලකිය යුතුය :—

(ඒ) සැලකිල්ලට භාජන වී පවත්නා කිසියම් වර්ෂයක පඩි පාලක සභා ආඥපනතේ (136 වන පරිච්ඡේදය) 25 වන වගන්තිය යටතේ සේව්‍යයා විසින් නිවාඩු දිනයක් වශයෙන් කම්කරුවාට දෙන ලද සෑම දවසක් ;

(බී) සේව්‍යයාගේ අනුමතිය ලද කවර හේතුවක් නිසා හෝ කම්කරුවා වැඩට නොපැමිණි සෑම දවසක් ;

(සී) සිය රක්ෂාවෙහි යෙදී සිටිය දී එයින්ම ඇතිවූ අනතුරකින් ලැබූ තුවාලයක් හේතුකොටගෙන කම්කරුවා වැඩට නොපැමිණි සෑම දවසක් ;

(ඩී) කම්කරු වන්දි පිළිබඳ ආඥපනතේ (139 වන පරිච්ඡේදය) III වන උපලේඛනයෙහි විස්තර වන කිසියම් වෘත්තිය රෝගයක් නිසා කම්කරුවා වැඩට නොපැමිණි සෑම දවසක් ;

(ඊ) ඇට කෙඳි කොහු රාත්තල් 42ක් පීරා බැඳීමට කම්කරුවාට හැකි වන පරිදි ප්‍රමාණවත් අමු ද්‍රව්‍ය ඔහුට සැපයීමට සේව්‍යයාට නොහැකි වූ හෝ ඔහු අසමත් වූ හෝ සෑම දවසක් ;

(එෆ්) නීත්‍යානුකූලවූ වැඩ නැවැත්වීමක් හෝ වැඩෙක් පිටමං කිරීමක් නිසා වැඩට නොපැමිණි සෑම දවසක් ; එහෙත් මෙවැනි දවස් ගණන කිසිම වර්ෂයක මුළුමනින් දින 30කට වැඩි නොවිය යුතුය ; සහ

(ජී) පඩි පාලක සභා ආඥපනත හැර වෙන යම්කිසි ග්‍රන්ථාරූඪ නීතියකින් හෝ නීතියක විධිවිධාන යටතේ හෝ වැඩට නොපැමිණ සිටීමට කම්කරුවකුට හිමිකම් ඇති සෑම දවසක් ද වේ ; එහෙත් පඩි පාලක සභා ආඥපනතේ 24 වන වගන්තිය යටතේ සතිපතා නිවාඩු දිනය වශයෙන් නියමිත දවස මීට නොඇතුළත්.

4. කම්කරුවකුගේ නිවාඩු දිනය හෝ නිවාඩු දින ගණන ඔහුත් ඔහුගේ සේව්‍යයාත් අතර අන්‍යෝන්‍ය වශයෙන් ගිවිස ගනු ලබන දිනයක හෝ දිනවල දිය යුත්තේය.

5. එක් එක් නිවාඩු දිනය වෙනුවෙන් ගෙවිය යුතු පාරිශ්‍රමිකයවූ කලි සුදුසුකම් ලබන වර්ෂයේ අවසාන හය මාසය ඇතුළත කම්කරුවාට නියම වශයෙන් වැඩ කර ඇති දින ගණනට ඔහු විසින් උපයා ඇති සම්පූර්ණ (අතිකාල දීමනා හැරයි) වේතන මුදල එම දින ගණනින් බෙද ලබා ගත යුතු ඔහුගේ දිනපතා වේතන සාමාන්‍යය වන්නේය.

6. නිවාඩු දිනය හෝ දින වෙනුවෙන් කරන්නාවූ ගෙවීම් ඒ නිවාඩු දිනය හෝ දිනයන් ආරම්භ වන්නට ප්‍රථම කළ යුතුය.

7. කම්කරුවෙක්, යම්කිසි දිනයක, සිය කැමැත්තෙන්ම රක්ෂාවෙන් අස්වීමට අදහස් කරයි නම් හෝ නැතහොත් රක්ෂාවෙන් නතර කරනු හෝ පහ කරනු ලැබීමට සිටියි නම්—

(ඒ) අන්තිමට ඉකුත් වූ වර්ෂය වෙනුවෙන් ඔහුට හිමිකම් තිබී ඔහු විසින් නොගන්නා ලද සෑම නිවාඩු දවසක් ; සහ

(බී) 1 වන ඡේදයෙහි සඳහන් රක්ෂාවට සහ වැඩපලවලට අදාළ විධිවිධාන පවත්නා වර්ෂය තුළ ඔහු විසින් ඒ වූ පරිද්දෙන්ම පිළිපදිනා ලද්දේ නම්, ඔහුගේ රක්ෂාව කෙළවර නොවන්නට, ඊළඟ වර්ෂයේ දී ඔහුට හිමිකම් ලැබිය හැකිව තිබුණ සෑම නිවාඩු දවසක් ද,

එදිනට පෙර ලබා ගැනීමට ඔහුට හිමිකම් ඇති අතර ඔහු විසින් ඒවා එසේ ලබා ගත යුත්තේ ද මෙම තීරණවල 5 වන ඡේදයේ විධිවිධානවලට අනුව එවැනි නිවාඩු දිනයන් සඳහා ඔහුට පාරිශ්‍රමිකය ගෙවිය යුත්තේ ද වේ.

8. ඉහත සඳහන් තීරණයන් 1960 ජනවාරි මස 1 වන දිනට පෙර කිසිම කාල සීමාවක වූ රක්ෂාවක් සම්බන්ධයෙන් අදාළ නොවන්නේය.

## 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පනත

### 21 (4) වෙනි වගන්තිය යටතේ කරන නියෝගය

කම්කරු හා ජනසතු සේවා පිළිබඳ අමාත්‍ය ධුරන්ධර මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1961 කේ 22 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන (සංශෝධන) පණතෙන් සංශෝධිත 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පනතේ 21 වෙනි වගන්තියේ (4) වෙනි උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට, මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි විස්තර දක්වා ඇති නිශ්චල දේපළවල අත්කරගැනීම 1962 ජූලි මස 1 වෙනිද සිට මේ නියෝගයෙන් අහෝසි කරමි.

ඇම්. පි. ද ඉසෙඩ්. සිරිවර්ධන,
කම්කරු හා ජනසතු සේවා පිළිබඳ අමාත්‍ය තැන.

1962 ජූනි මස 18 වෙනි දින,
කොළඹදීය.

### උපලේඛනය

| දේපළ | පිහිටීම හා සෙසු විස්තර |
|---|---|
| 1. සීමා සහිත යුනයිටඩ් බස් රථ සමාගම විසින් පාවිච්චි කරන ලද දේපළ— | |
| පර්චස් 20ක් පමණ වර්ග ප්‍රමාණය ඇති (නමක් නැති) ඉඩම හා එහි වූ... සියලුම ගොඩනැගිලි. | මහනුවර නාගරික සීමාවන් ඇතුළත මහනුවර කටුගස්තොට පාරේ උතුරට මහයා අල්ලද, නැගෙනහිරට කේ. ඩබ්ලිව්. ඩෙවිඩ්ට හා අල්පා රේඩියෝ සේවාවට අයිති ඉඩමද, දකුණට මහපාරද, බස්නාහිරට චන්ද්‍රා ට්‍රුවර්ස් සමාගමට අයිති ඉඩමද යන මේ මායිම් තුළ පිහිටි 136 වෙනි වරිපණම් අංකය දරණ ස්ථානය. |
| 2. සීමා සහිත (1952) සවුත් වෙස්ටර්න් ඔම්නි බස් රථ සමාගම විසින් පාවිච්චි කරන ලද දේපළ— | |
| මීගහලියැද්ද නම් මුඩු ඉඩමෙන් වර්ග ප්‍රමාණයෙන් පර්චස් 10ක් පමණවූ... කොටස | ගාලු දිස්ත්‍රික්කයේ බද්දේගම නම් ගමේ උතුරට ගිං ගඟද, නැගෙනහිරට ඉහළ පොල්වත්තය, මැදිලියැද්දය, මීගහඕවිට ය යන ඉඩම්ද, දකුණට මීගහඕවිට නම් ඉඩම හා මහපාරද, බස්නාහිරට මහපාර හා ගිං ගඟද යන මේ මායිම් තුළ පිහිටා තිබේ. |

6–1337

---

## සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත

### 40 වන වගන්තිය යටතේ වැසීමේ නියෝගය

සාප්පු සහ කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ (129 පරිච්ඡේදය) 40 වන වගන්තියෙන් පැවැරී ඇති බලතල පිට කම්කරු හා ජනසතු සේවා ඇමැති තුමන් විසින් සකස් කරන ලදුව එම පනතේ 42 වන වගන්තිය යටතේ උත්තර මන්ත්‍රී මණ්ඩලයෙන් සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන් සම්මත වූ නියෝගයයි.

ඇම්. පී. ද ඉසැඩ්. සිරිවර්ධන,
කම්කරු හා ජනසතුසේවා ඇමති.

1962 ජූනි 18 වැනි දින,
කොළඹ දී ය.

### නියෝගය

වර්ෂ 1938 අංක 66 දරන සාප්පු ආඥාපනතේ 15 වන වගන්තිය යටතේ පනවා, වර්ෂ 1953 අප්‍රේල් මස 10 වන දින අංක 10,517 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ වැසීමේ නියෝගය මෙහි පහත දක්වෙන පරිදි මෙයින් වෙනස් කරනු ලැබේ :—

(1) 1 වන ඡේදයේ "පළමුවන, දෙවන හා තුන්වන උපලේඛන යන්හි නියමිත ප්‍රදේශවල" යන වචන අස්කොට ඒ වෙනුවට ඒ "කවර උපලේඛනයක හෝ නියමිත ඕනෑම ප්‍රදේශයක" යන වචන යෙදීමෙන් ;

(2) 2 වන ඡේදයේ—

(අ) "කොණ්ඩා සහ රැවුළු කපන ස්ථානයක් හා බාබර් සාප්පුවක්" යන වචන එකට යෙදී ඇති සෑම ස්ථානයක ඒ වචන අස්කොට ඒ වෙනුවට "කොණ්ඩා සහ රැවුළු කපන ස්ථානයක්, බාබර් සාප්පුවක්, රජක ස්ථානයක්, රෙදි වේලා පිරිසිදු කරන සාප්පුවක් සහ රෙදි සායම් කරන සාප්පුවක්" යන වචන යෙදීමෙන් ; සහ

(ආ) එහි (3) වන අනුච්ඡේදයට පසුව ඊළඟටම පහත සඳහන් අභිනව අනුච්ඡේද යෙදීමෙන් :—

"(4) (1) මෙම නියෝගයේ 4 වන සහ 5 වන ඡේදවල ප්‍රකාශිතව සැලසූ අන් විධිවිධාන ඇතොත් මිස නැතහොත් මෙයට යාකොට ඇති සිව්වන උපලේඛනයෙහි නියමිත ප්‍රදේශයේ පිහිටි කොණ්ඩා සහ රැවුල් කපන ස්ථානයක්, බාබර් සාප්පුවක් රජක ස්ථානයක්, රෙදි වේලා පිරිසිදු කරන සාප්පුවක් සහ රෙදි සායම් කරන සාප්පුවක් නොවන (3 වන ඡේදයේ විධිවිධාන අදාල වන වෙළෙඳ ශාලාවක් හෝ නොවන) සෑම සාප්පුවක්—

(අ) සෑම සතියක සිකුරාදා හැර එක් එක් දවසෙහි පෙරවරු 9 වන තුරු ද,

(ආ) සෑම සතියක බ්‍රහස්පතින්දා පස්වරු 2 ට සහ ඉන් පසුව ද,

(ඇ) සෑම සතියක ඉරිදා, අඟහරුවාදා සහ සෙනසුරාදා පස්වරු 6 ට සහ ඉන් පසුව ද,

(ඈ) සෑම සතියක සඳුදා සහ බදාදා පස්වරු 7 ට සහ ඉන් පසුව, සහ

(ඉ) සෑම සතියක සිකුරාදා දිනය මුළුල්ලේ ද

ගනු දෙනුකරුවන් සමඟ ගනුදෙනු සඳහා විවෘත නො කර තිබිය යුතුය.

(II) මෙයට යාකොට ඇති සිව්වන උපලේඛනයෙහි නියමිත ප්‍රදේශයෙහි පිහිටි සෑම කොණ්ඩා සහ රැවුළු කපන ස්ථානයක්, බාබර් සාප්පුවක්, රජක ස්ථානයක්, රෙදි වේලා පිරිසිදු කරන ස්ථානයක් හා රෙදි සායම් කරන ස්ථානයක්—

(අ) සෑම සතියක සිකුරාදා හැර එක් එක් දවසෙහි පෙරවරු 7 වන තුරු ද,

(ආ) සෑම සතියක බෘහස්පතින්දා පස්වරු 5 ට සහ ඉන් පසුව ද,

(ඇ) සෑම සතියක ඉරිදා, සඳුදා, අඟහරුවාදා, බදාදා සහ සෙනසුරාදා පස්වරු 7 ට සහ ඉන් පසුව, සහ

(ඈ) සෑම සතියක සිකුරාදා මුළුල්ලේ ද

ගනුදෙනුකරුවන් සමඟ ගනුදෙනු සඳහා විවෘත කර නො තිබිය යුතුය.

(5) (1) මෙම නියෝගයේ 4 වන සහ 5 වන ඡේදවල ප්‍රකාශිතවම සැලසූ අන් විධිවිධාන ඇතොත් මිස නැතහොත් මෙයට යාකොට ඇති පස්වන උපලේඛනයෙහි නියමිත කවර ප්‍රදේශයක වුව පිහිටි කොණ්ඩා සහ රැවුළු කපන ස්ථානයක්, බාබර් සාප්පුවක්, රජක ස්ථානයක්, රෙදි වේලා පිරිසිදු කරන සාප්පුවක් සහ රෙදි සායම් කරන සාප්පුවක් නොවන (3 වන ඡේදයේ විධිවිධාන අදාල වන වෙළෙඳ ශාලාවක් හෝ නොවන) සෑම සාප්පුවක්—

(අ) සෑම සතියක ඉරිදා මුළුල්ලේ ද,

(ආ) සෑම සතියක සෙනසුරාදා පස්වරු 2 ට සහ ඉන් පසුව ද,

(ඇ) සෑම සතියක සඳුදා, අඟහරුවාදා සහ බෘහස්පතින්දා පස්වරු 7 ට සහ ඉන් පසුව ද,

(ඈ) සෑම සතියක බදාදා සහ සිකුරාදා පස්වරු 8 ට සහ ඉන් පසුව ද,

(ඉ) සෑම සතියක සෙනසුරාදා පෙරවරු 9 වන තුරු, සහ

(ඊ) සෑම සතියක සඳුදා, අඟහරුවාදා, බදාදා, බෘහස්පතින්දා සහ සිකුරාදා පෙරවරු 10 වන තුරු ද,

ගනුදෙනුකරුවන් සමඟ ගනුදෙනු සඳහා විවෘත නොකර තිබිය යුතුය.

(II) මෙයට යා කොට ඇති පස්වන උපලේඛනයෙහි නියමිත කවර ප්‍රදේශයක හෝ පිහිටි සෑම කොණ්ඩා සහ රැවුළු කපන ස්ථානයක්, බාබර් සාප්පුවක්, රජක ස්ථානයක්, රෙදි වේලා පිරිසිදු කරන සාප්පුවක් සහ රෙදි සායම් කරන ස්ථානයක්—

(අ) සෑම සතියක ඉරිදා හැර එක් එක් දවසෙහි පෙරවරු 7 වන තුරු ද,

(ආ) සෑම සතියක සෙනසුරාදා පස්වරු 5 ට සහ ඉන් පසුව ද

(ඇ) සෑම සතියක සඳුදා, අඟහරුවාදා, බදාදා, බෘහස්පතින්දා සහ සිකුරාදා පස්වරු 7 ට සහ ඉන් පසුව සහ

(ඈ) සෑම සතියක ඉරිදා මුළුල්ලේ ද

ගනුදෙනුකරුවන් සමග ගනුදෙනු සඳහා විවෘත නොකර තිබිය යුතුය.

(3) 3 වන ඡේදයේ "පළමුවන" යන වචනයේ සිට "වේවා" යන වචනය තුන්වන වරට සඳහන් වී ඇති තැන දක්වා වූ සියලු වචන අස්කොට ඒ වෙනුවට "කවර උපලේඛනයක හෝ නියමිත සීමාව ප්‍රදේශයක පිහිටියා වූ" යන වචන යෙදීමෙන් ;

(4) 4 වන ඡේදයේ—

(අ) "පළමුවන උපලේඛනයෙහි හෝ දෙවන උපලේඛනයෙහි හෝ තුන්වන උපලේඛනයෙහි හෝ" යන වචන අස්කොට ඒ වෙනුවට "කවර උපලේඛනයක හෝ" යන වචන යෙදීමෙන්,

(ආ) එහි (ආ) අනුච්ඡේදයෙහි "පස් පැයකට" යන වචන අස් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස යෙදීමෙන් :
"එය කොණ්ඩා සහ රැවුල් කපන ස්ථානයක්, බාබර් සාප්පුවක්, රජක ස්ථානයක්, රෙදි වේළා පිරිසිදු කරන සාප්පුවක් හෝ රෙදි සායම් කරන සාප්පුවක් නම් පැ දහයකට හා වෙනයම් කිසි සාප්පුවක් නම් පස් පැයකට" සහ

(ඇ) එහි (ඇ) අනුච්ඡේදයෙහි "නව පැයකට" යන වචන අස් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස යෙදීමෙන් :

"එය කොණ්ඩා සහ රැවුල් කපන ස්ථානයක්, බාබර් සාප්පුවක්, රජක ස්ථානයක්, රෙදි වේළා පිරිසිදු කරන සාප්පුවක් හෝ රෙදි සායම් කරන සාප්පුවක් නම් දොළොස් පැයකට හා වෙනයම් කිසි සාප්පුවක් නම් එබඳු දවස් තුනක නව පැයකට හා එබඳු දවස් දෙකක පැ දහයකට";

(5) 5 වන ඡේදයේ එහි (2) වන අනුච්ඡේදයෙහි (ඇ) කොටසට පසුව ඊ ළඟටම පහත දැක්වෙන අළුත් කොටස යෙදීමෙන් :—

"(ඈ) 2 (4) වන ඡේදයේ විධිවිධාන අදාල වන කවර සාප්පුවක් වුව—

(I) සෑම සතියක ඉරිදා, සඳුදා, අඟහරුවාදා, බදාදා සහ සෙනසුරාදා පෙරවරු 9 සිට පස්වරු 8 දක්වා, එහෙත් ඉන් නො පසු ද,

(II) සෑම සතියක බෘහස්පතින්දා සහ සිකුරාදා පෙරවරු 9 සිට පස්වරු 6 දක්වා, එහෙත් ඉන් නො පසු ද

ගනුදෙනුකරුවන් සමග ගනුදෙනු සඳහා විවෘත කර තැබිය හැකිය.

(6) එසට යා කොට ඇති පළමුවන උපලේඛනයේ—

(අ) එහි (I) වන ඡේදයෙහි "දෙහිවල-ගල්කිස්ස" යන වචන—

(I) "කොළඹ" යන වචනය අස්කොට ඒ වෙනුවට "කොල්ලුපිටිය, බම්බලපිටිය සහ වැල්ලවත්ත යන කොට්ඨාශ තුළ පිහිටි ප්‍රදේශ හැර කොළඹ" යන වචන යෙදීමෙන් සහ

(II) එම ඡේදය අගට "දෙහිවල-ගල්කිස්ස" යන වචන එකතු කිරීමෙන් ද

(7) එයට යාකොට ඇති තුන්වන උපලේඛනයේ (1) වන ඡේදයෙහි "කඩුගන්නාව" යන වචනය අන්හැරීමෙන් සහ

(8) තුන්වන උපලේඛනයට පසුව ඊළඟටම පහත දැක්වෙන අභිනව උපලේඛන යෙදීමෙන් ද වේ:—

## සිව්වන උපලේඛනය

කඩුගන්නාවේ පළාත් අණ්ඩු සහ පාලන සීමා තුළ පිහිටි ප්‍රදේශ.

## පස්වන උපලේඛනය

කොළඹ නගර සභාවේ කොල්ලුපිටිය, බම්බලපිටිය සහ වැල්ලවත්ත යන කොට්ඨාශ තුළ පිහිටි ප්‍රදේශ".

6-1113

---

## පඩි පාලක සභා ආඥාපනත

### නිවේදනයයි

අයිස් සහ සිසිල් බීම සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවේ සාමාජිකයකු වූ ඇස්. ඞී. රූම් මහතා 1962 මැයි මස 1 වන දින සිට දිවයිනෙන් බැහැර සිටින කාලය තුළදී එම පඩි පාලක සභාවේ සේවා නියෝජිත සාමාජිකයෙකු ලෙස වැඩබැලීමට පඩි පාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතුසේවා ඇමති තුමන් විසින් බී මැක්විකර් මහතා පත් කරන ලද බව වර්ෂ 1943 පඩි පාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ඇස්. ඇම්. ද මැල්,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්වරයා.

1962 ජූනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

6-1238

---

## පඩි පාලක සභා ආඥාපනත

### නිවේදනයයි

රා, අරක්කු සහ විනාකිරි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවේ සාමාජිකයකුව සිට මියගිය කේ. ඒ. ප්‍රේමසිංහ මහතා වෙනුවට එම පඩි පාලක සභාවේ සේවා නියෝජිත සාමාජිකයෙකු ලෙස පෙනී සිටීමට පඩි පාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු හා ජනසතුසේවා ඇමති තුමන් විසින් චන්ද්‍රා වල්ගම මහතා පත් කරන ලද බව වර්ෂ 1943 පඩි පාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ඇස්. ඇම්. ද මැල්,
කම්කරු හා ජනසතු සේවා අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්වරයා.

1962 ජූනි මස 20 වැනි දින,
කොළඹ දී ය.

6-1237

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුලත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

1962 ජූනි 13 වැනි දින දීය.
කොළඹ 2.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, නවදුන් කෝරලය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ, පනාවැන්න වසම ගම්මුලාදැනි වසමේ පිහිටි පනුගල් පොත්තේවත්ත නැමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර 2½ ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට : අ. ග. සි. 34 ලොට් 86 ජේ කැබැල්ලේ ඉතිරිව ඇති උතුරු කැබැල්ල ; නැගෙනහිරට : අ. ග. සි. 34 ලොට් 86 ජේ ඉතිරිව ඇති නැගෙනහිර කොටසේ ඇති වතු පාර ; දකුණට : අ. ග. සි. 34 ලොට් 86 ජේ ඉතිරි දකුණු කැබැල්ල සහ වතු පාර ; බටහිරට : අ. ග. සි. 34 ලොට් 86 කේ. 6 දරණ ඉඩම.

6-1101

---

## 1954 අංක 38 දරණ ජාතික නිවාස පනත

### 49 ඡේදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡේදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡේදයෙහි අදහසට ඇතුලත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

1962 ජූනි මස 15 වැනි දින දීය.
කොළඹ 2.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, බටහිර සියනෑකෝරළ අධිකාරි පත්තුව ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ අංක 267 දරණ උතුරු තලවතුගේන්පිට ගම්මුලාදෑනි වසමේ පිහිටි කෝන් ගහවත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති පර්චස් 13 ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට: එච්. ඩේවිඩ් පෙරේරාට අයිති ඉඩම; නැගෙනහිරට: කොළඹ-මහනුවර ප්‍රසිද්ධ පාර; දකුණට: සී. සී. අබේකෝන්ට අයිති එම ඉඩමේ ඉතිරි කොටස; බස්නාහිරට: එල්. වයලට් කබ්රාල්ට සහ අනික් අයට අයිති කුඹුර.

6-1163

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡෙදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡෙදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡෙදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමති තුමා.

1962 ජූනි මස 15 වැනි දින දීය.
කොළඹ 2.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ අංක 419 දරණ කලපලුවාව ගම්මුලාදෑනි වසමේ පිහිටි හික්ගහවත්ත නොහොත් දෙල්ගහවත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති පර්චස් 8 ක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට: පොදු නානාළිඳ සහ එම ඉඩමේ ඉතිරි කොටස; නැගෙනහිරට: වැලිකඩ-අයි.ඩී.එච්. ප්‍රසිද්ධ පාර; දකුණට: එම ඉඩමේ ඉතිරි කොටස; බස්නාහිරට: දාවිත් පෙරේරා මහතාට අයිති ඔවිට.

6-1146

---

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡෙදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡෙදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡෙදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමතිතුමා.

1962 ජූනි මස 15 වැනි දින දීය,
කොළඹ 2.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ, අංක 572 දරණ දේමළදූව ගම් මුලාදෑනී වසමේ පිහිටි මාරගහවත්ත නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති පර්චස් 67 ක් පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට: ඒ. සී. ඊ. සමරවීර මහතාට අයිති මෙම ඉඩමේම ඉතිරි කොටස; නැගෙනහිරට: කැස්බෑව-බණ්ඩාරගම ප්‍රසිඛ පාර; දකුණට: අඩි 12 පළලැති පාරක් සඳහා වෙන්කර ඇති එම ඉඩමේ කොටසක්; බස්නාහිරට: පී. ලීලාරත්න මහතාට අයිති මෙම ඉඩමේ ඉතිරි කොටස.

6-1145

## 1954 අංක 37 දරණ ජාතික නිවාස පනත

### 49 ඡෙදය යටතේ සහතිකය

පළාත් පාලන හා නිවාස පිළිබඳ ඇමතිවර, මහානාම සමරවීර වන මම, 1954 අංක 37 දරණ ජාතික නිවාස පනතේ 49 වන ඡෙදය යටතේ මා වෙත පවරා ඇති බලතල උඩ මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම එම පනතෙහි 2 වන ඡෙදයෙහි අදහසට ඇතුළත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

මහානාම සමරවීර,
පළාත් පාලන හා නිවාස ඇමතිතුමා.

1962 ජූනි මස 19 වැනි දින දීය.
කොළඹ 2.

## උපලේඛනය

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, ගඟබොඩ පත්තුව ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ අංක 218 දරණ බටහිර උඩුගම ගම් මුලාදෑනි වසමේ පිහිටි වනපොලුගහදවනවත්ත නොහොත් කුරුන්ද නමැති ඉඩමෙන් පහත සඳහන් පරිදි මායිම් ඇති අක්කර දෙකක පමණ ප්‍රමාණයක ඉඩම් කොටසක් :—

උතුරට: උඩුගම-යටලමත්ත ප්‍රසිඛ පාර; නැගෙනහිරට: තැපැල් කායඝාලයයට අයත් ඉඩම; දකුණට: ඇල; බස්නාහිරට: ගම් මුලාදෑනි කායඝාලය පිහිටි ඉඩම.

6-1158

---

ඇල්. ඩී. බී. 50/37.

## සමුපකාර සමිති පිළිබඳ ආඥාපනත

සමුපකාර සමිති පිළිබඳ ආඥාපනතේ (124 වෙනි පරිච්ඡේදය) 57 වෙනි වගන්තියෙන් පැවරී තිබෙන බලතල අනුව වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු භාර ඇමතිතුමා විසින් කරන ලද නියෝගයයි.

ජී. බී. ඉලංගරත්න,
වාණිජ, වෙළඳ, ආහාර හා නැව්
පිළිබඳ ඇමති.

1962 ජූනි 19 දින,
කොළඹදීය

### නියෝගය

සමුපකාර සමිති පිළිබඳ ආඥාපනතේ (124 වෙනි පරිච්ඡේදය) 41 (1) වෙනි වගන්තිය අනුව ශුඩ ලාභයෙන් සංචිතයට ගෙන ගිය යුතු අඩුම ප්‍රමාණය හතරෙන් එක වෙනුවට සියයට දහයක් විය යුතුය. යන සංශෝධනය සහිතව, සමුපකාර සමිති පිළිබඳ ආඥාපනතේ (124 වෙනි පරිච්ඡේදය) 41 (1) වෙනි වගන්තියේ විධාන සීමාසහිත රොක්වුඩ් වත්තේ සමුපකාර කඩ සමිති කෙරෙහි බලපානු ලැබේ.

6-1138

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## අපනයන පාලන දැන්වීම අංක 7/62

### ඉවත ලන කඩදාසි අපනයනය

1962.2.16 වෙනි දින අංක 12,934 දරන රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 2/62 දරන අපනයන පාලන දැන්වීමට වැඩි මනත්වය. 1962 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වන තවත් 6 මසක කාලපරිච්ඡේදයක් සඳහා ඉවත ලන කඩදාසි අපනය නයට ඉඩදෙන බව අපනයනකයන් වෙත මෙයින් දැනුම් දෙමි.

සී. මයි[illegible]වාගනම්,
ආනයන හා අපනයන පාලක.

1962 ජූනි මස 23 වෙනි දින,
කොළඹදීය.

6-1349

---

මගේ අංකය: පීවීඑස්. 675.

## වෙළෙඳ සමාගම් ආඥාපනත (145 වැනි පරිච්ඡේදය)

### 227 (4) වැනි වගන්තිය යටතේ "සීමාසහිත අයිලන්ඩ් ටුවර්ස්" විසුරුවා හැරීමේ දැන්වීම

### සාමාජිකයින්ගේ ඉච්ඡානුග නිමා කිරීම

ඇවර කැරෙමින් පවත්නා සීමාසහිත අයිලන්ඩ් ටුවර්ස් සමාගමේ අවසාන නිමා කිරීමේ රැස්වීමේ වාර්තාව හා සමග ඇවර කරුගේ ගිණුමේ පිටපතක් ලැබ 1962 ජූනි මස 13 දින ලියාපදිංචි කරන ලද හෙයින්,

යථොක්ත දින සිට තෙමසක් ඉකුත් වූ පසු සීමාසහිත අයිලන් ඩී වුවර්ස් සමාගම වෙළෙඳ සමාගම් ආඥාපනතේ (145 වැනි පරිච්ඡේදය) 227 (4) වැනි වගන්තියේ විධිවිධාන යටතේ විසුරුවා හරින ලද සේ සැලැකෙන බව දැන ගනිත්වා.

ඩබ්ලිව්. ඇම්. සෙල්ලයියා,
වෙළෙඳ සමාගම් රෙජිස්ට්‍රාර්.

1962 ජූනි මස 18 දින,
වෙළෙඳ සමාගම් ලියාපදිංචි කිරීමේ
දෙපාර්තමේන්තුවේදීය.

6-1107

## දැන්වීමයි

උතුරු පලාතේ යාපනය දිස්ත්‍රික්කයේ දූපත (කයිට්ස්) කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ ඇනලායතිවු දූපතේ ගවයින් අතර, "බ්ලැක් ක්වාටර්" නමැති රෝගය පැතිරී යන බැවි 1957 තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වර්ෂ 1962 ජූනි 1 දින අංක 13,145 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි.

1962 ජූනි 19 වැනි දින,
පේරාදෙනියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
කායඝීලයේ දීය.

6-1144

## ප්‍රකාශනයයි

බටහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හොරම්පල්ලේ ගම්පති කොට්ඨාශයේ යාකවටුව ගමේ ගවයන් අතර "හෙමරජික් සෙප්ටි සීමියා (රක්තාශ්‍රව)" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආරියදාස අමරසිංහ වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට : වටිනාපහ ; දකුණට : වාගොව්ව ; නැගෙනහිරට : හළු කන්දන ; බස්නාහිරට : බුලුගහ මුල්ල.

2. මෙම ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගවයන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර මීගමුව පශු වෛද්‍ය තැනගෙන් හෝ අළුත්කුරුකෝරලේ උතුර බී කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කායඝීලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩි දුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතු යි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 ජූනි 13 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කායඝීලයේ දීය.

6-1100

## ප්‍රකාශනයයි

වයඹ පළාතේ හලාවත දිස්ත්‍රික්කයේ කුදිරිප්පුව ගම්පති කොට්ඨාශයේ ගවයන් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන්පත් ආරියදාස අමරසිංහ වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥාපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට : හීනගර සහ උරේලිය ගම්පති කොට්ඨාශ ; දකුණට : හේනපොල ගම ; නැගෙනහිරට : ගල්මුරුව ගම්පති කොට්ඨාශය ; බස්ණාහිරට : හොරකැලේ ගම.

2. මෙම ආඥාපනතේ 7 වැනි වගන්තිය ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර හලාවත පශු වෛද්‍ය තැනගෙන් හෝ පිටිගල් කෝරලේ උතුර කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරි තැනගේ කායඝීලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වලංගු වන බව දත යුතු යි.

ආරියදාස අමරසිංහ,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි තැන.

1962 ජූනි 19 වැනි දින,
පේරාදෙනියේ රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරි තැනගේ කායඝීලයේ දීය.

6-1162

## උඟුරුගොඩවත්ත, අවිස්සාවේල්ල පාරේ දුම්රිය හරස්පාරේ රථවාහන ගමනාගමනය පාලනය කිරීම

1962 ජූනි මස 28 වැනි දින සිට ඉහත සඳහන් දුම්රිය හරස් පාරේ පිහිටි ලී ගේට්ටුව ඉවත් කර, ඒ වෙනුවට විදුලි මෝටරයකින් ක්‍රියා කරවන හරස්පොලු ගේට්ටුවක් (උඩට පහතට ක්‍රියා කරවන) සවි කරනු ලැබේ. දුම්රිය හරස් පාර හරහා ඇති මහා මාර්ගය, රථ වාහන හැසිරවීම සඳහා කොටස් දෙකකට බෙදනු ලැබ, මහ මාර්ගයේ යොදා ඇති වර්ණාලෝක සංඥා ක්‍රමය අනුව, මෙම ගේට්ටුව ඉදිරියෙන් ද, වර්ණාලෝක සංඥා සවිකර ඇත. පහත දැක්වෙන පිළිවෙලට අනුකූලව ක්‍රියාත්මක වන ආලෝක සංඥා සියලුම රියදුරන් විසින් පිළිපැදිය යුතු වෙයි.

1. සෑම බැරියරයකටම අඩි 15ක් ඉදිරියෙන්, මහා මාර්ගය හරහා "නැවතීමේ රේඛාව" නමින් හැඳින්වෙන ධවල රේඛාවක් (White Line) සෑම ආලෝක සංඥාවක් හා සම්බන්ධිතව සලකුනු වෙයි.

2. නැවතීමේ රේඛාවේ සිට අඩි 9ක් පිටුපසින් රතු, කහ සහ කොල යන ත්‍රී වර්ණයෙන් යුත් ලාම්පු තුනකින් සමන්විත වර්ණාලෝක සංඥාවක් රථවාහන පේලිය පාලනය කිරීමට ඊට අභිමුඛව ඉදිකර ඇත.

3. රතු පැහැති ලාම්පුව ඉහලින් ද, කොල පැහැති ලාම්පුව පහලින් ද දැක්වෙන පරිදි ලම්භාකාරව මෙම සංඥා පුවරුව පිළියෙල කර ඇත.

4. රථ වාහන පාලනය සඳහා පහත දැක්වෙන අනුක්‍රමයෙන් ආලෝක සංඥා දිස්වනු ඇත—

(අ) ලාම්පු ලෙන්සයේ "Stop" යන්න සඳහන් රතු වර්ණය.
(ආ) කහ සහ රතු එක විටම.
(ඇ) ලාම්පු ලෙන්සයේ "Go" යන්න සඳහන් කොල වර්ණය.
(ඈ) කහ වර්ණය පමණක්.

5. ඉහත සඳහන් සංඥාවලින් අදහස් වන දෑ පහත පලවේ :—

(අ) කොල සංඥුව දිස්වන තුරු නැවතීමේ රේඛාවෙන් ඉදිරියට නොයා යුතු බව රතු සංඥුවෙන් අදහස් කරයි.

(ආ) රතු පැහැයෙන් කොල පැහැයට, ලඟම ඇති වෙනස් වීමක් රතු සමග දිස්වන කහ සංඥුවෙන් ප්‍රකාශ වෙයි. එහෙත් රතු සංඥුවෙන් දැක්වෙන තහනම වෙනස් නොවෙයි.

(ඇ) ප්‍රවේසම් සහිතව ඉදිරියට ගමන් කළ යුතු බවත්, එමෙන්ම රථ වාහන පාලනය කරන පොලිස් නිලධාරියෙකු විසින් හෝ බලය ලත් අන් කිසිවකු විසින් හෝ නිකුත් කරන හැසිරවීම් වලට යටත්ව සංඥුව පසුකළ යුතු බවත්, කොල පාට සංඥුවෙන් ප්‍රකාශ වෙයි.

(ඈ) සංඥුව, රතු පැහැයට ලඟම වෙනස් වීමක් සිදුවන බව තනිව ඇති කහ සංඥුව දක්වයි. එය නැවතීමේ රේඛාවෙන් ඉදිරියට කිසිම වාහනයක් නොයා යුතු බවට ලකුනක් බව සැලකිය යුතුයි.

6. මෙම වර්ණාලෝක සංඥු, යම් අවස්ථාවක ක්‍රියා විරහිත වුව හොත්, මෙම දුම්රිය පාර හරහා ඇති ගේට්ටුව සමීපයෙහි සිට කරනු ලබන අත් සංඥුවලට සියලුම රියදුරන් අවනත විය යුතුය.

6-1108

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායකමුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි